GMOA

ESTABLISHED IN
1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

26-06-2012

**මාධ්‍ය නිවේදනය**

උතුරු නැගෙනහිර යුද්ධය පවතින සමයේදී පවා එම ප්‍රදේශවල රෝහල් වෛද්‍යවරුන්ගේ හිඟයකින් තොරව පවත්වාගෙන යන ලදී. විවිධ දුෂ්කරතා මධ්‍යයේ වුවද අපගේ වෛද්‍යවරුන් උතුරු නැගෙනහිර ජනතාවට කැපවීමෙන් යුතුව සෞඛ්‍ය සේවය පවත්වාගෙන ගිය බැවින් අපගේ සෞඛ්‍ය සේවාවට අත පෙවීමට තිබූ විදේශිය බලපෑම් ද අවම විය.

උතුරු නැගෙනහිර ප්‍රදේශවල සේවය කරන වෛද්‍යවරුන්ට වසරක සේවා කාලයකට පසුව රටේ අනෙකුත් ප්‍රදේශවලට පැමිණීමට ස්ථානමාරු නියෝගයන් ලබා දෙන ලදී එසේ වසර 2ක් 3ක් පමණ කාලයක් උතුරු නැගෙනහිර ප්‍රදේශවල සේවය කිරීමට ඔවුනට සිදු වෙයි. යුද්ධය නිම වුවත් යුද්ධයෙන් පීඩිත ජනතාව සිටින ප්‍රදේශවල වෛද්‍යවරුන් නොමැති රෝහල් තවමත් පවතින අතර මුලතිව්, කිලිනොච්චි වැනි ප්‍රධාන රෝහල් පවත්වාගෙන යනු ලබන්නේද අවම වෛද්‍යවරුන් ප්‍රමාණයකිනි.

උතුරු නැගෙනහිර ස්ථාන මාරු ලැයිස්තුව අවලංගු කර දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල දුෂ්කර ස්ථාන මාරු ඇතුලත් වන ලෙස ස්ථාන මාරු ලේඛනයක් සැකසීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය යෝජනා කල අතර එය සෞඛ්‍ය අමාත්‍යංශය විසින්ද පිලිගන්නා ලදී. එසේ වුවද නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවය එම නිසා ස්ථාන මාරු ලේඛනය පිලියෙල කිරීම ප්‍රමාද වී ඇති අතර නිලධාරීන් අත්තනොමතික ලෙස උතුරු නැගෙනහිර පොරොත්තු ලේඛනයද අවලංගු කිරීමට ක්‍රියා කර ඇත. එම නිසා උතුරු නැගෙනහිර ප්‍රදේශවලට වෛද්‍යවරුන් නොමැති වී යුද්ධයෙන් පීඩාවට පත් ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය බිඳ වැටීමට ඉඩ ඇත.

නව පත්වීම් ලබන 800ක් පමණ වන වෛද්‍යවරුන්ගෙන් 350ක පමණ සංඛ්‍යාවක් උතුරු නැගෙනහිර ප්‍රදේශවල , වෛද්‍යවරුන් නොමැති රෝහල් ද ඇතුලත් වනසේ සේවයේ යෙදවීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය උත්සාහ කලද නිලධාරීන්ගේ මෙම අත්තනෝමතික ක්‍රියාව නිසා එම උත්සහයද කඩාකප්පල් වනු ඇත. මෙමගින් උතුරු නැගෙනහිර ප්‍රදේශවල වෛද්‍යවරුන්ගේ හිඟයක් ඇති වී ජනතාව අපහසුතාවයට පත් වී රටට එල්ලවන බලපෑම් හමුවේ රජය පත් වන අපහසුතාවන් වලට මෙම නිලධාරීන් වගකිවයුතු බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය අවධාරණය කරයි.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වැඩි දුරටත් අවධාරණය කරනුයේ යෝජිත දුෂ්කර ස්ථාන හඳුනාගැනීමේ ලේඛනය පිලියෙල කරන තුරු මෙතෙක් ක්‍රියාත්මක කල උතුරු නැගෙනහිර ස්ථාන මාරුවීම් ලේඛනය පවත්වාගෙන යා යුතු බවත් එමගින් යුද්ධයෙන් පීඩාවට පත් උතුරු නැගෙනහිර ජනතාවගේ සෞඛ්‍ය සේවය අඛණ්ඩව පවත්වාගෙන යා යුතු බවත්ය.

ස්තූතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්